ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2012 අගෝස්තු මස 23** |

## 2012 ජුනි මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය

මෙම වසරේ මුල් කාලයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, 2012 වසරේ ජුනි මාසයේ දී මෙන්ම දෙවන කාර්තුව මුළුල්ලේම ගෙවුම් තුලනයෙහි වෙළෙඳ ශේෂයෙහි හිඟය මැඩපවත්වා ගැනීම සඳහා දායක විය. 2011 ජුනි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 848 ක් සහ 2011 දෙසැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 942 ක්ව පැවැති වෙළෙඳ ශේෂයෙහි හිඟය, 2012 ජුනි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 663 ක් දක්වා සැලකිය යුතු අයුරින් පහත වැටුණි. මෙය, 2011 වසරේ පෙබරවාරි මාසයේ සිට මේ දක්වා වන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ අඩුම වෙළෙඳ ශේෂය වේ.






පෙර වසරේ අනුරූප කාලය සමග සලකන විට 2012 අප්‍රේල් මාසයේ සිට පහත වැටුණු ආනයන වියදම, 2012 ජුනි මාසයේ දී සියයට 15 කින් තවදුරටත් පහත වැටුණි. පසුගිය වසර තුළ දී වෙළෙඳ හිඟය පුළුල්වීම සඳහා සැලකිය යුතු අයුරින් දායක වූ ආනයන කාණ්ඩයන් කිහිපයක්ම සඳහා වූ වියදම පහත වැටීම මේ සඳහා මූලික වශයෙන් හේතු විය. ජුනි මාසයේ දී ද ඊට පෙර මාසයේ දී මෙන් මෝටර් වාහන සහ රත්‍රං ආනයනය සඳහා වූ වියදම අඩු විය. මෝටර් වාහන සහ රත්‍රං ආනයන සඳහා වූ වියදම් පිළිවෙළින් සියයට 58.9 කින් හා සියයට 71.1 කින් පහත වැටුණි. මෙම අඩුවීම අන්තර් භාණ්ඩ වූ තිරිඟු සහ රබර් ආශ්‍රිත නිෂ්පාදිත ආනයනයන්වල අඩුවීම තුළින් ද දක්නට ලැබුණි. අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයන අතර වූ බොරතෙල් ආනයන සඳහා වූ වියදම, ලෝක වෙළෙඳපොළේ බොරතෙල් මිල පහළ යාමේ බලපෑම පිළිබිඹු කරමින් ජුනි මාසය සඳහා වන ආනයන වියදම පහත හෙළීම සඳහා දායක විය. මේ අතර පෙර මාසවල දී අඛණ්ඩව ඉහළ වර්ධනයන් වාර්තා කළ ආයෝජන භාණ්ඩ ආනයන ද 2012 ජුනි මාසයේ දී පහත වැටීමක් වාර්තා කරන ලදී.

අපනයන පිළිබඳ සැලකීමේ දී, ඉන්දියාව සහ තායිලන්තය ඇතුළු අනෙකුත් බොහෝ ආසියාතික රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ අපනයන ආදායම ද පසුගිය මාසවල දී පහත වැටුණි. කපු හා රබර් වැනි වෙළෙඳ භාණ්ඩයන්හි ජාත්‍යන්තර මිල ගණන්වල දක්නට ලැබුණු සැලකිය යුතු පහත වැටීම, පසුගිය මාස කිහිපයෙහි ශ්‍රී ලංකාවේ අපනයන ආදායම පහත වැටීම සඳහා දායක විය. ඒ අතර විශේෂයෙන්ම යුරෝපීය කලාපයේ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සමග ගෝලීය වශයෙන් ඉල්ලුම පහත වැටීම, රබර් ආශ්‍රිත නිෂ්පාදිත වැනි භාණ්ඩයන් සඳහා ඇති ඉල්ලුම අඩු වීම ජුනි මාසය වන විට අපනයන සඳහා අයහපත් අයුරින් බලපා ඇත. එහෙත්, අපනයන සඳහා වැඩිම දායකත්වයක් ලබාදෙන ඇඟළුම් අපනයන සඳහා ප්‍රධාන වෙළෙඳපොළවල් මගින් පවතින ඉල්ලුම තවදුරටත් ස්ථායීව පැවතීම හේතුවෙන් ඇඟළුම් අපනයන පරිමාව බොහෝදුරට නොවෙනස්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතර, ශ්‍රී ලංකා රේගුව විසින් මීට පෙර මාස දෙක සඳහා වන විදේශ වෙළෙඳාම සම්බන්ධ දත්ත සංශෝධනය කරන ලදී. ප්‍රධාන අපනයන සහ ආනයනවල ප්‍රධාන කාණ්ඩයන්හි මෙන්ම ගෙවුම් තුලනයෙහි වෙළෙඳ ශේෂයට අදාළ සංශෝධිත දත්ත, සංඛ්‍යා සටහන 1 මගින් දක්වා ඇත. දත්ත සංශෝධනයෙන් අනතුරුව අප්‍රේල් සහ මැයි මාසය සඳහා අපනයන එකතුව එ.ජ.ඩොලර් මිලියන 1,553.7 ක් වන අතර, එය මෙම වසරේ මීට පෙර ප්‍රකාශයට පත්කළ අගයන්ට වඩා එ.ජ.ඩොලර් මිලියන 163.5 ක වැඩිවීමකි. ඒ අනුව 2012 මැයි මාසය වන විට දී වෙළෙඳ ශේෂයෙහි හිඟය ද එවැනිම අගයකින් පහත වැටී ඇත.

## සංඛ්‍යා සටහන 1. විදේශීය වෙළෙඳාම - 2012 [අ]

| | 2012 ජනවාරි | 2012 පෙබරවාරි | 2012 මාර්තු | 2012 අප්‍රේල් | 2012 මැයි | 2012 ජුනි | 2012 ජනවාරි සිට ජුනි |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | **919.2** | **878.8** | **857.4** | **747.8** | **805.9** | **755.8** | **4,965.0** |
| මෙයින්, | | | | | | | |
| **කෘෂිකාර්මික** | **181.5** | **185.3** | **208.7** | **177.2** | **212.4** | **178.2** | **1,143.3** |
| මෙයින්, තේ | 103.9 | 105.1 | 126.7 | 105.2 | 139.7 | 101.4 | 682.0 |
| **කාර්මික** | **703.0** | **630.5** | **640.2** | **559.9** | **590.6** | **574.5** | **3,698.7** |
| මෙයින්, රෙදිපිළි හා ඇඟළුම් | 366.6 | 341.5 | 328.1 | 323.2 | 312.3 | 310.6 | 1,982.3 |
| රබර් නිෂ්පාදිත | 78.2 | 75.2 | 80.6 | 61.5 | 74.0 | 64.0 | 433.5 |
| ආහාර පාන හා දුම්කොළ | 20.8 | 22.8 | 27.2 | 23.3 | 25.3 | 19.8 | 139.2 |
| **ඛනිජ ද්‍රව්‍ය** | **2.6** | **4.1** | **7.7** | **9.9** | **2.3** | **2.4** | **29.0** |
| **ආනයන** | **1,915.0** | **1,580.7** | **1,736.4** | **1,440.4** | **1,575.0** | **1,419.0** | **9,666.5** |
| මෙයින්, | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **287.7** | **251.0** | **343.4** | **242.0** | **268.5** | **230.9** | **1,623.5** |
| මෙයින්, ආහාර හා පාන වර්ග | 124.5 | 111.4 | 134.7 | 96.0 | 119.0 | 108.0 | 693.6 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 163.2 | 139.6 | 208.7 | 145.9 | 149.5 | 122.9 | 929.9 |
| **අන්තර් භාණ්ඩ** | **1,096.5** | **947.4** | **985.8** | **838.5** | **972.5** | **914.2** | **5,754.8** |
| මෙයින්, ඛනිජ තෙල් | 515.1 | 505.6 | 414.8 | 362.2 | 376.6 | 400.1 | 2,574.5 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 203.0 | 137.8 | 191.3 | 182.3 | 194.5 | 192.8 | 1,101.6 |
| **ආයෝජන භාණ්ඩ** | **523.3** | **379.7** | **406.0** | **359.0** | **331.9** | **272.4** | **2,272.3** |
| මෙයින්, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 250.3 | 161.6 | 163.4 | 184.5 | 164.5 | 127.8 | 1,052.0 |
| ප්‍රවාහන උපකරණ | 144.7 | 117.2 | 141.5 | 82.5 | 73.4 | 53.2 | 612.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 127.7 | 100.6 | 100.8 | 91.8 | 93.7 | 91.1 | 605.7 |
| **වෙළෙඳ ශේෂය** | **-995.8** | **-701.8** | **-878.9** | **-692.6** | **-769.1** | **-663.2** | **-4,701.5** |

(අ) තාවකාලික

ගෙවුම් තුලනයේ සේවා ගිණුම වෙත වූ ලැබීම් සලකා බැලීමේ දී, සංචාරක ඉපැයීම් 2012 ජුනි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 63 ක් දක්වා පෙර වසරේ ජුනි මාසයට සාපේක්ෂව සියයට 20.6 කින් වර්ධනය විය. මේ අතර, සංචාරක ඉපැයීම් 2012 වසරේ ප්‍රථම මාස හය තුළ දී එ.ජ.ඩොලර් මිලියන 460 ක් දක්වා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 24.3 කින් ශක්තිමත් ලෙස වර්ධනය විය. 2012 වසරේ ජුනි මාසයේ සංචාරක පැමිණීම් සංඛ්‍යාව 65,245 ක් දක්වා සියයට 21.6 කින් ඉහළ ගිය අතර, ඒ අනුව පළමු මාස හය තුළ සංචාරක පැමිණීම් සංඛ්‍යාව 452,867 ක් දක්වා ඉහළ ගියේය.

2012 ජුනි මාසයේ දී සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් මිලියන 452 ක් දක්වා සියයට 12.1 කින් වර්ධනය වූ අතර, 2012 පළමු මාස 6 තුළ දී සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 2,942 ක් දක්වා සියයට 17.4 කින් වර්ධනය විය. ඒ අනුව, ශුද්ධ ජංගම සංක්‍රාම, ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුම ශක්තිමත් කිරීමට තවදුරටත් උපකාරී විය.

2012 වසරේ පළමු භාගය තුළ දී ගෙවුම් තුලනයේ ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම වෙත සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් ලැබුණි. 2012 වසරේ පළමු මාස 6 තුළ ලැබුණු විදේශීය ඍජු ආයෝජන ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 452 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2012 වසරේ මුළු විදේශීය ඍජු ආයෝජන ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 2 ක ඉලක්කගත මට්ටමක් කරා ළඟා වනු ඇතැයි ආයෝජන මණ්ඩලය විසින් විශ්වාසය පළ කර ඇත. 2012 වසරෙහි ජුනි මාසය අවසාන වන විට කොළඹ කොටස් වෙළෙඳපොළ ලද ශුද්ධ විදේශීය ආයෝජන ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 187 ක් විය. මීට අමතරව, 2012 වසරේ ජනවාරි - ජුනි කාලපරිච්ඡේදය තුළ දී වාණිජ බැංකුවල දිගුකාලීන ණය ගැනීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 927.5 ක් විය. රාජ්‍ය සුරැකුම්පත්හි විදේශීය ආයෝජන කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින්, 2012 වසරේ පළමු මාස හත තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා වූ ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 842 ක් විය. තවද, 2012 වසරේ පළමු මාස හය තුළ දී රජයේ දිගුකාලීන ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 1,084 ක් විය.

2012 ජුනි මාසය අවසාන වන විට, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 6,045 ක් වූ අතර, දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය, එ.ජ.ඩොලර් මිලියන 7,415 ක් විය. විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2012 ජුනි මාසය අවසාන වන විට දී පැවැති දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.5 කට සමාන වූ අතර, මුළු විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.3 කට සමාන විය. මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම යටතේ නමවන සහ අවසාන වාරිකය වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 414 ක් ලැබීම, පස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව මගින් එ.ජ.ඩොලර් බිලියන 1 ක් ලැබීම සහ අනෙකුත් විදේශීය ලැබීම් හේතුවෙන්, 2012 ජූලි මාසය අවසාන වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 7.1 ක් දක්වා වර්ධනය වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

# සංඛ්‍යා සටහන 2. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - ජූනි 2012 [(අ)]

| | 2011 ජූනි එ.ජ.ඩො. මිලියන | 2012 ජූනි එ.ජ.ඩො. මිලියන | ජූනි වර්ධනය (සියයට) | 2011 ජනː සිට ජූනි එ.ජ.ඩො. මිලියන | 2012 ජනː සිට ජූනි එ.ජ.ඩො. මිලියන | ජනː සිට ජූනි වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | **820.4** | **755.8** | **-7.9** | **5,075.9** | **4,965.0** | **-2.2** |
| මෙයින්, | | | | | | |
| කෘෂිකාර්මික | 201.8 | 178.2 | -11.7 | 1,214.4 | 1,143.3 | -5.9 |
| මෙයින්, තේ | 117.3 | 101.4 | -13.6 | 711.6 | 682.0 | -4.2 |
| කාර්මික | **615.9** | **574.5** | **-6.7** | **3,840.9** | **3,698.7** | **-3.7** |
| මෙයින්, රෙදිපිළි හා ඇඟළුම් | 331.4 | 310.6 | -6.3 | 2,014.6 | 1,982.3 | -1.6 |
| රබර් නිෂ්පාදිත | 75.3 | 64.0 | -15.0 | 411.5 | 433.5 | 5.3 |
| ආහාර පාන හා දුම්කොළ | 31.1 | 19.8 | -36.2 | 168.7 | 139.2 | -17.5 |
| ඛනිජ ද්‍රව්‍ය | **2.2** | **2.4** | **10.9** | **16.2** | **29.0** | **78.6** |
| ආනයන | **1,668.6** | **1,419.0** | **-15.0** | **9,280.1** | **9,666.5** | **4.2** |
| මෙයින්, | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | **310.2** | **230.9** | **-25.6** | **1,791.5** | **1,623.5** | **-9.4** |
| මෙයින්, ආහාර හා පාන වර්ග | 142.8 | 108.0 | -24.3 | 817.1 | 693.6 | -15.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 167.5 | 122.9 | -26.6 | 974.4 | 929.9 | -4.6 |
| අන්තර් භාණ්ඩ | **1,010.7** | **914.2** | **-9.6** | **5,643.6** | **5,754.8** | **2.0** |
| මෙයින්, ඛනිජ තෙල් | 343.9 | 400.1 | 16.3 | 2,146.8 | 2,574.5 | 19.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 202.8 | 192.8 | -4.9 | 1,157.4 | 1,101.6 | -4.8 |
| ආයෝජන භාණ්ඩ | **344.9** | **272.4** | **-21.0** | **1,822.4** | **2,272.3** | **24.7** |
| මෙයින්, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 170.6 | 127.8 | -25.1 | 922.0 | 1,052.0 | 14.1 |
| ප්‍රවාහන උපකරණ | 77.5 | 53.2 | -31.4 | 424.9 | 612.5 | 44.2 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 96.4 | 91.1 | -5.4 | 473.6 | 605.7 | 27.9 |
| වෙළෙඳ ශේෂය | **-848.2** | **-663.2** | **-21.8** | **-4,204.2** | **-4,701.5** | **11.8** |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | **403.5** | **452.3** | **12.1** | **2,506.6** | **2,942.4** | **17.4** |
| විදේශීය සෘජු ආයෝජන | | | | **394.1** | **451.7** | **14.6** |
| විවිධ ආයෝජන (ශුද්ධ) | **-7.1** | **4.7** | **166.2** | **-66.7** | **186.5** | **379.6** |
| වාණිජ බැංකු විසින් ලබා ගත් දිගුකාලීන විදේශ ණය | | | | | **927.5** | |
| සංචාරක ඉපැයීම් | **52.0** | **62.8** | **20.8** | **370.1** | **459.9** | **24.3** |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ආ) | **557.7** | **454.2** | **-18.6** | **1,510.6** | **2,277.5** | **50.8** |

(අ) තාවකාලික

(ආ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.